12.

ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කිරීම.

කුමාර රත්නායක

සාලිය යාලේපොල

12.1
නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් විමර්ශනය කිරීම.

නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් හඳුනා ගැනීමේ පහසුව සඳහා අවධි 05කට බෙදා දැක්විය හැකිය.

1. 1948 – 1960 දක්වා අවධිය.
2. 1961 – 1977 දක්වා අවධිය.
3. 1977 – 1994 දක්වා අවධිය.
4. 1994 – 2015 දක්වා අවධිය.
5. 2015න් පසු අවධිය.

01. 1948 – 1960 දක්වා අවධිය.

මෙම අවධියේ ප්‍රධාන ලක්ෂණ.....

1. යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිත ව ක්‍රියාත්මක වීම.
2. ලෝක බැංකු බලපෑම් ප්‍රථම වතාවට ආර්ථිකය මත පතිත වීම.
3. ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්තවලට ප්‍රබල තැනක් ලබා දීම.
4. යැපුම් කෘෂිකර්මාන්තය හා ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති වීම.
5. ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම.

6. ආර්ථික ක්‍රම සම්පාදනය හා සැලසුම් සම්පාදනය ආරම්භ වීම.
7. අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
8. පුළුල් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වීම.
9. ජනසතු ව්‍යාපාර ආරම්භ වීම.

02. 1961 – 1977 දක්වා අවධිය.

මෙම අවධියේ ප්‍රධාන ලක්ෂණ ....

1. අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
2. විනිමය පාලනය, ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
3. ආනයන පාලනය.
4. විදේශ විනිමය අර්බුද ඇති වීම.
5. ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ වීම.
6. අපනයන විවිධාංගීකරණය.
7. රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම.
8. දේපොළ හා වත්කම් ප්‍රතිව්‍යාප්තිකරණය.
9. විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය.

මෙම අවධි දෙක තුළ ක්‍රියාත්මක වූයේ ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තියකි.

- ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය යනු විදේශ රටවලින් ආනයනය කරන භාණ්ඩ සීමා කර දේශීය එම භාණ්ඩ දේශීය ව නිෂ්පාදනය කිරීමට පසුබිම සකස් කිරීමයි.
- පළමු ව සුඛෝපභෝගී භාණ්ඩ හා අත්‍යවශ්‍ය නො වන භාණ්ඩ ආනයනය සීමා කළ අතර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම ආරම්භ කළේ ය.
- දෙවනුව අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සීමා කළ අතර ඒවා දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවමාරු කිරීම මඟින් වෙළෙඳ පොල අතරමැදියන් ලබන වාසිය සීමා කළේ ය. (හාල්, මිරිස්, ලූණු ප්‍රවාහනය සීමා කිරීම)

- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදිතයන් ලෙස සහල්, ලූණු, මිරිස්, කවුපි, මුං ඇට, කුරක්කන් ආදී නිෂ්පාදනයන් දිරිගැන්වීය.
- ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදි පිළි, ඇඟළුම් බෙහෙත් ද්‍රව්‍ය ආදී පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරි ගැන්වීය.
- මෙකල පැවති විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා මෙම ආනයන පාලනය හා විදේශ විනිමය වෙළෙඳ පොළ සීමා කිරීම් සිදුකරන ලදී.

03. 1978 – 1994 දක්වා අවධිය.

මෙම අවධියෙ ප්‍රධාන ලක්ෂණ ....

1. අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වය.
2. ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති වීම.
3. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය ඉවත් කර පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
4. පාලන ප්‍රතිපත්ති ඉවත් කර ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම.
5. ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරීම.
6. ආර්ථිකය විවෘත කිරීම.
7. ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටු වීම.
8. පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
9. දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

04. 1994 – 2015 දක්වා අවධිය.

මෙම අවධියේ ප්‍රධාන ලක්ෂණ ....

1. දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කිරීම.
2. විදේශ ආයෝජන සීමා වීම.
3. උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම.
4. විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම.
5. දේශීය කර්මාන්ත හා ඉදිකිරීම් කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.

මෙම අවධි දෙක තුළ ක්‍රියාත්මක වූයේ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියකි.

- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය යනු අපනයන භාණ්ඩවලට ආදේශන ලෙස දේශීය වෙළෙඳ පොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළෙඳ පොළ ඉලක්ක කොට ගෙන තරගකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්තියකි.
- මෙම ප්‍රතිපත්තිය ලංකාවේ ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් 1977 න් පසු කාල පරිච්ඡේදය තුළ ය.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක ප්‍රධානම ඉලක්කය වන්නේ ආනයන සීමා කිරීම නො ව අපනයන තරගකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මඟින් ලෝක වෙළෙඳ පොළ තුළ සිය කොටස පුළුල් කර ගැනීම ය.

1977න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ සෙසු ඉල්ක්ක වූයේ.......

- ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය.
- විදේශ විනිමය ගැටලු නිරාකරණය.
- ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය.
- අපනයන ඉලක්ක කර ගත් කාර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
- සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය.
- විදේශ විනිමය වෙළෙඳ පොළ ප්‍රසාරණය කරනු පිණිස අපනයන ප්‍රසාරණය.

අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ...

- මෙය විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.
- නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිද ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම.
- විදේශ විනිමය සීමා ඉවත් කිරීම.
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම.
- නිල විනිමය ක්‍රමය හා වි. වි. හි. ස. විනිමය අනුපාතය අහෝසි කොට ඉල්ලුම හා සැපයුම මත තීරණය වන නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ඇති කිරීම.

- විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% අවප්‍රමාණය කිරීම.
- විදේශ විනිමය වෙළෙඳ පොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම.
- ආනයන තීරු බදු ඉවත් කිරීම හා ආනයන තීරුබදු ලිහිල් කිරීම.
- අපනයනය සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කර තරගකාරීත්ව අපනයනයට අවස්ථාව ලබාදීම.

05. 2015න් පසු අවධිය.
(දැනුම් කේන්ද්‍රීය වෙළෙඳ පොළ ආර්ථිකය)

- නව ආණ්ඩුවක් බලයට පත්වීම.
- 2025 ආර්ථික දැක්ම වැඩසටහන අනුව 2025 වර්ෂය වන් විට ලංකාව පොහොසත් රටක් බවට පත් කිරීම මෙහි අරමුණ විය.
- 2017 – 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහනට අනුව රජයේ ඉලක්කය වන්නේ,
    1. ඵලදායිතාව හා තරගකාරීත්වය දියුණු කිරීම මඟින් අපනයනවල අදායම අඩුවීම වැළැක්වීම.
    2. ආයෝජන හිතකාමී ප්‍රතිපත්ති තුළින් විදේශ ආයෝජන ගලා ඒම ප්‍රවර්ධනය කිරීම.
    3. රාජ්‍ය ආදායම ඉහළ නැංවීම රාජ්‍ය වියදම් ඉහළ නැංවීම හා රාජ්‍ය වියදම් සාංකෝචනය කිරීමට අවශ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

4. වාර්ෂික රාජ්‍ය ණය සේවා බර අඩු කර ගැනීම සඳහා රාජ්‍ය ණය ප්‍රති ව්‍යුහගත කිරීම.
5. මානව සම්පත්වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය වියදම් වැඩි කිරීම.
6. ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයේ ගුණාත්මක බව තහවුරු කිරීම.
7. පරිසර ආරක්ෂණය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.

12. 2

ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා.

නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් දෙකකි.

1. දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්.
2. සේවා නියුක්තියේ ව්‍යුහමය වෙනස්කම්.

01.
දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්.

දළදේශීය නිෂ්පාදිතයේ ව්‍යුහය කාලීන ව පහත පරිදි වෙනස් වී ඇත.

- කෘෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම.
- කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම.
- සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම.

02.

සේවා නියුක්තියේ ව්‍යුහය වෙනස් වීම.

සේවා නිකුයුක්තියේ ව්‍යුහය කාලීන වශයෙන් වෙනස් වී ඇත.

- කෘෂි අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩු වී ඇත.
- කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.
- සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.

සේවා නියුක්තිය 1963 – 2016

අංශය	දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස										
	1977	1993	2000	2012	2014	2016	2017	2018	2019	2020	2021
කෘෂිකාර්මික	26.7	21.2	19	11.1	10.1	7.1	6.9	7	7	7.9	6.9
කාර්මික	22.5	22.5	25.3	30.4	32.3	26.8	26.8	26.1	26.4	25.5	25.9
සේවා	50.1	51.3	54.7	58.6	57.6	56.5	56.8	57.6	57.4	56.7	58.3



දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය තුළ හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය තුළ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම අඩු වී කාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම සහ සේවා අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම වැඩි වී ඇත.

1977න් පසු ශ්‍රී ලංකාව වඩාත් විවෘත ආර්ථික රටාවක් කරා මාරු වීමත් සමඟ ශ්‍රීලාංකීය සේවකයන් විදේශ සේවා නියුක්තිය සඳහා යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇති බව පෙනී යයි. එහි අතුරු ඵලයක් ලෙස විදේශවලින් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.

ආර්ථික වර්ධනය සඳහා අනුගමනය කළ උපාය මාර්ග

1. විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ.
2. යටිතල පහසුකම් සංවර්ධනය.
3. සංචාරක කර්මාන්තය.
4. දැනුම් ආර්ථිකය.
5. ප්‍රදේශීය සංවර්ධනය.

01.
විදේශ සේවා නියුක්තිය හා ප්‍රේෂණ.

විදේශ සේවා සංක්‍රමණ - 2017 - 2020

විදේශ සේවා නියුක්තිය	2017		2018		2019		2020	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
මුළු විදේශ රැකියා	211 992	100	211 459	100	203 186	100	53 771	100

නිපුනතාව අනුව සංක්‍රමණ සේවා නියුක්තිය 2017



විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා

1. 2016 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටත් ව යන්නන්ගේ 7.8% පහළ යාමක් වාර්තා විය.
2. විදේශ සේවා සඳහා පිටත්ව යන්නන් අඛණ්ඩ ව අඩුවීමට හේතු වූයේ ගෘහ සේවිකා පිටත්ව යාම අඩු කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, පිටත්වීමට පෙර සපුරාලිය යුතු පුහුණු අවශ්‍යතා හා මැද පෙරදිග රටවල ආර්ථික පසුබෑසීම හේතුවෙන් ශ්‍රම ඉල්ලුම පහළ යාමයි.
3. දකුණ කොරියාවේ රැකියා සඳහා පිටත් වීම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද ඉන් වැඩි ප්‍රතිශතයක් (97%) නුපුහුණු ශ්‍රමික කණ්ඩායමට අයත් වේ.

4. පුහුණු කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත් වීම වැඩි වන විට විදේශ ප්‍රේෂණ ගලා ඒම වැඩි වනු ඇත.
5. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2017 අය - වැය මඟින් යෝජනා කළ පරිදි නුපුහුණු ශ්‍රමිකයෙකුගේ අවම වැටුප $ 350ක් ලෙස ද පුහුණු ශ්‍රමිකයෙකුගේ අවම වැටුප $ 450ක් ලෙස ද නියම කරන ලදී.

විදේශ ප්‍රේෂණ

විදේශ සේවා නියුක්ත ලාංකික ශ්‍රමිකයන් මෙරටට එවන විදේශ මුදල් හා වෙනත් දෑ විදේශ ප්‍රේෂන ලෙස හඳුන්වයි. ලංකාවේ මුළු විදේශ ලැබීම් තුළ ඉහළ ම වැදගත්කම හිමි කර ගන්නේ විදේශ ප්‍රේෂණයන් ය.

විදේශ රැකියා සඳහා සංක්‍රමණයන් 2009 – 2017

කාණ්ඩය	2009	2010	2011	2012	2013	2014	2015	2016[අ]	2017[ආ]
විදේශ සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ (රු. මිලියන)									
මැද පෙරදිග	229,298	279,688	335,201	428,593	460,195	509,487	512,437	566,260	565,642
වෙනත්	153,503	185,684	233,902	335,387	367,494	406,857	436,520	488,229	526,330
මැද පෙරදිග ප්‍රේෂණ, මුළු ප්‍රේෂණවල % ක් ලෙස	59.9	60.1	58.9	56.1	55.6	55.6	54.0	53.7	51.8
මුළු ප්‍රේෂණ, අපනයන ඉපැයීම්වල % ක් ලෙස	47.0	47.8	48.7	61.3	61.6	63.1	66.3	70.3	63.0

විදේශ ප්‍රේෂණ ලැබීම්වල අඩුවීමක් 2013වර්ෂයේ දී වාර්තා කළ ද 2016 වර්ෂයේ දී එය මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. පසුගිය වසරවල විදේශ ප්‍රේෂණ අඩු වී ඇත්තේ මැද පෙරදිග රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන් ක්‍රමයෙන් අඩු වීම හා මැද පෙරදිග රටවල ආර්ථික පසුබෑසීම නිසා ශ්‍රම ඉල්ලුම අඩුවීම ය.

විදේශ සේවා නියුක්තිය හා විදේශ සේවා ප්‍රේෂණ ලැබීම් ආර්ථිකය මත ඇති කරන බලපෑම

1. සේවා නියුක්ති අනුපාතය පහළ යාමට හේතු වීම.
2. පුද්ගලයින්ගේ ආදායම් ඉහළ යාම.
3. දරිද්‍රතාව පහළ යාම.
4. කුටුම්භ ඉතුරුම් වැඩි වී කුඩා ව්‍යාපාර වර්ධනය වීම.
5. විදේශ ඉපැයීම් වර්ධනය වීම.
6. ගෙවුම්ශේෂ ගැටලුවලට ප්‍රබල විසඳුමක් වීම.
7. විදේශ වත්කම ශක්තිමත් වීම.

8. මුදලේ විදේශ අගය ශක්තිමත් වීම.
9. දේශීය ශ්‍රම වෙළෙඳ පොළේ පුහුණු ශ්‍රමික හිගයක් ඇති වීම හා වැටුප් මට්ටම් ඉහළ යාම.
10. පුහුණු ශ්‍රමය විදේශ ගත වන විට සම්පත් සම්භාරය සංකෝචනය වීම.
11. ගෘහ සේවා සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටලුවලට හා දරුවන් හුදෙකලා වීම අනාරක්ෂිත වීමට හේතු වීම.

02.
යටිතල පහසුකම් සංවර්ධනය.

රටක නිෂ්පාදනය හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට උපස්තම්භනය වන ප්‍රාග්ධනය යටිතල පහසුකම් වශයෙන් හැඳින්විය හැකිය.

එම යටිතල පහසුකම් මේ ආකාරයට වර්ග කළ හැකි ය.

යටිතල පහසුකම්

ආර්ථික යටිතල පහසුකම්

දෘඩ පහසුකම්

- මහා මාර්ග
- අධිවේගී මාර්ග
- පාලම්
- උමං
- දුම්රිය මාර්ග
- වාරි මාර්ග
- ගුවන් තොටුපළ
- වරාය
- විදුලි සංදේශ
- ප්‍රවාහන පද්ධති

මෘදු පහසුකම්

- වෘත්තීය පුහුණු වැඩ සටහන්
- මූල්‍ය ආයතන පහසුකම්
- පර්යේෂණ හා සංවර්ධන පහසුකම්
- තාක්ෂණ හුවමාරුව
- අපනයන දිරිගැන්වීම්

සමාජ යටිතල පහසුකම්

දෘඩ පහසුකම්

- රෝහල්
- පාඨශාලා
- ජල සම්පාදනය
- නිවාස
- ළමා රැකවරණය
- වැඩිහිටි රැකවරණය
- බන්ධනාගාර
- කසළ බැහැර කිරීම

මෘදු පහසුකම්

- සමාජ ආරක්ෂණය
- ප්‍රජා සේවය
- පරිසරය සුරැකීමේ ව්‍යාපෘති

❖ යටිතල පහසුකම් සඳහා වන ආයෝජනය යනු ආර්ථිකය කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍යය කෙරෙන සේවා හා පහසුකම් සැපයීමට භෞතික හා සංවිධාන ව්‍යුහයන් ගොඩනැගීම ය. යටිතල පහසුකම් සංවර්ධනය රටක හෝ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබිඹු කෙරෙන වැදගත් දර්ශකය කි.

❖ යටිතල පහසුකම් ක්ෂේත්‍රය ආර්ථික හා සමාජයීය වශයෙන් උප කොටස් දෙකකට වර්ග කළ හැකි ය.

1. ආර්ථික යටිතල පහසුකම්.
2. සමාජ යටිතල පහසුකම්.

ආර්ථික යටිතල පහසුකම් යනු,
මහාමාර්ග, ජල සම්පාදන, හා ජලාපවහන පහසුකම්, සන්නිවේදන පහසුකම්, ජාල යනාදිය යි.

සමාජ යටිතල පහසුකම් යනු,
පාසල්, විශ්වවිද්‍යාල, රෝහල්, නිවාස සංවර්ධනය යනාදිය යි.

- යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජනය ආර්ථික වෘද්ධියට විවිධාකාරයෙන් දායක වේ.

යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ දෙන ප්‍රධාන බාධකයකි. අසතුටුදායක මං මාවත්, වාහන තදබද ය, කෙටි දුරක් ගමන් කිරීමට බොහෝ කාලයක් ගතවීම යනාදිය සංවර්ධන ක්‍රියාවලියට බලපාන සරල බාධක වේ.

මහා මාර්ග, පාලම්, වරාය, දුම්රිය මාර්ග, සන්නිවේදන ජාල, වාරිමාර්ග පහසුකම් සංවර්ධනය කිරීම ආර්ථික වෘද්ධියට විශාල අනුබලයක් වේ.

- යටිතල පහසුකම් සංවර්ධනය වී ඇති විට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ ඒවා වෙළෙඳ පොළට බෙදාහැරීම ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව කළ හැකි ය.
- මෑත දී කරන ලද පර්යේෂණ හා අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත්තේ යටිතල පහසුකම් ඉහළ යන සෑම 10%ක් පාසා ම දිගුකාලීන නිමැවුම 1%කින් වර්ධනය වන බවයි.

සමාජයීය වශයෙන් වැදගත්වීමට හේතු.

1. ඵලදායිතාව ඉහළ යාම.
2. ආර්ථික වෘද්ධිය වේගවත් වීම.
3. ආයෝජකයින් ආකර්ෂණය කිරීමට පිටිවහල් වීම.
4. ආයෝජකයින්ගේ පෞද්ගලික පිරිවැය අඩු වීමට ඉවහල් වීම.
5. අපතේ යාම් හා නාස්තිවීම් අවම වීමට ඉවහල් වීම.
6. කළමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂම වීම.
7. ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීමට ඉවහල් වීම.
8. සමාජ සංවරධනයට හේතු වීම.
9. මානව ප්‍රාග්ධනය බිහිවීමට හේතු වීම.
10. ආර්ථිකයේ තරගකාරීත්වය ඉහළ යාම.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවේශ වන මූලාශ්‍ර කිහිපයක්.

1. යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන.
2. යටිතල පහසුකම් සඳහා ස්වේච්ඡා ආයෝජන.
3. යටිතල පහසුකම් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය. (PPP)

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජන

යටිතල පහසුකම් සඳහා වූ රාජ්‍ය ආයෝජන

වර්ෂය	ආර්ථික සේවා		සමාජ සේවා		එකතුව	
	රු. බිලියන	ද.දේ.නි. % ලෙස	රු. බිලියන	ද.දේ.නි. % ලෙස	රු. බිලියන	ද.දේ.නි. % ලෙස
2014	330.1	3.2	112.3	1.1	442.5	4.3
2015	429.0	3.9	124.4	1.1	553.4	5.1
2016	424.0	3.5	117.3	1.0	541.3	4.5
2017	474.1	3.5	135.4	1.0	609.5	4.5
2018 (ආ)	437.9	3.3	133.2	1.0	571.1	4.3

(ආ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 5%කට ආසන්න වේ.
- නමුත් ආර්ථිකයේ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහාත් ,ආර්ථික වෘද්ධියේ උපරිම මට්ටමට ළඟා වීම සඳහාත් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කිරීම සඳහාත් යටිතල පහසුකම් සංවර්ධනයේ ආයෝජන තවදුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පවතී.
- ඒ සඳහා ප්‍රබල බාධාවක් වන්නේ රාජ්‍ය ආදායම් සීමිත වීම, රාජ්‍ය ණය ඉහළ යාම වළක්වා ගැනීම, රාජ්‍ය ණය ආපසු ගෙවීමේ හැකියාව සීමිත වීම ආදිය යි.
- මේ තත්ත්වය යටතේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම ඉතා වැදගත් වේ.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ස්වේච්ඡා ආයෝජන

- මෙහි දී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය දිරි ගැන්වීමට ලෝක බැංකුවේ හා USAID ආයතනයේ සහය ඇති ව මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2017 ජනවාරි මාසයේ දී අමාත්‍යාංශ අනුමැතිය හිමි විය.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය දිරි ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව මඟින් දේශපාලඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවිය යුතු අතර පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම සහ සේවාවල ගුණාත්මක බව සහ සාධාරණ මිල ගණන් සහතික කිරීමට සුදුසු නිගමන හා පරිපාලන යාන්ත්‍රණය නිර්මාණය කළ යුතු ය.

- ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල පෞද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා,
    - ස්ථාවර ප්‍රතිපත්ති.
    - යහපාලනය.
    - විනිවිද භාවය.
    - ආයතනික හැකිය වර්ධනය වැඩි දියුණු කිරීම.
    - ඵලදායිතා නියාමනයන් හා කාර්යක්ෂම මූල්‍ය වෙළෙඳ පොළ.

  අවශ්‍යය වේ.

- මේ අතර කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන්කිරීම තහවුරු කිරීම සඳහා ආර්ථිකයට වැඩි ප්‍රතිලාභ හිමිවන අයුරෙන් ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙළ හඳුනා ගැනීමට යටිතල පහසකම් ව්‍යාපෘති පුළුල් ශක්‍යතා අධ්‍යයනයකට ලක් කළ යුතු ය.

යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය.

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සාර්ථක ක්‍රමවේදයකි.මෙහි දී තම තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශවයන් විසින් තෝරා ගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය හැකි ය.
- ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වළක්වා ගත හැකි ය. කාර්යය සාධනය මනින දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය සැලකිය හැකි ය.
- තනිකර ම රාජ්‍ය අංශය හෝ පෞද්ගලික අංශය හෝ ඉටු කරන ව්‍යපෘතියකට වඩා ඉහළ ආයෝජන ලාභ අනුපාතිකය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති මඟින් අත් කර ගත හැකිය. දෙපාර්ශවය ම එක් ව ක්‍රියාත්මක කරන විට සැලසුම් කිරීම හා මූල්‍යනය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.

- ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමට ලක් කර එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ හෝ දේශපාලනික අවශ්‍යතා සහ වෙනත් අභිලාශයන් මත ශක්‍යතාවකින් තොර ව ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමට සැලසුම් කරනු ලැබුවහොත් පෞද්ගලික අංශය එවැන්නක් කිරීමට එකඟ නො වේ.
- පිරිවැය පාලනය කිරීමෙහිලා වඩා පළපුරුද්ද හා අත්දැකීම් ඇති පෞද්ගලික අංශය වෙත ව්‍යාපෘති මෙහෙයවීමට හා ක්‍රියාවට නැගීමේ අවදානම් පැවරීමට රජයට අවස්ථාව සැලසේ.
- බොහෝ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති තුළ කල්තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රසාද දීමනා (Bonus) අතුළත් වන බැවින් සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂම ව නිම කිරීමට හැකියාව ලැබේ.

- රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ලෙස වැය කිරීමට මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත්කමක් ඇති වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව සැලසේ.
- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය රාජ්‍ය මූලයට වාසිදායක වේ. අයවැය පරතරය අඩු කර ගැනීමට දායක වනු ඇත.
- ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරකදී ම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබෙනු ඇත.
- රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ජනතාව මත බදු බර ද අඩු විය හැකි ය.
- පෞද්ගලීකරණ ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධයක් පවතින විට එයට සාර්ථක ව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති දැක්විය හැකි ය.

03. සංචාරක කර්මාන්තය.

- ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයන් වන සංචාරක කර්මාන්තය අඛණ්ඩ ව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්වයි. ඉතිහාසයේ පළමු වර මිලියන දෙකෙහි සන්ධිස්ථානය පසු කරමින් 2016 වසරේ දී සංචාරක පැමිණීමේ සංඛ්‍යාව 2 050 832 ක් දක්වා 14% කැපී පෙනෙන වාර්ෂික වර්ධනයක් වාර්තා කළේ ය.
- සංචාරක කර්මාන්තයෙ පවරධනය සඳහා උපකාරී වූ සාධක කිහිපයකි.
  1. සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කළ ආයෝජන ඉහළ යාම.
  2. නව ගුවන් සේවා, මඟී නෞකා සේවා ක්‍රියාත්මක වීම.
  3. ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම.
  4. ලෝකයේ ප්‍රධාන සංචාරක ගමනාන්තවල භූගෝලීය, දේශපාලනික අවිනිශ්චිතතා වර්ධනය කිරීම.

- අප්‍රිකානු කලාපය හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලෙන් ම සංචාරක පැමිණීම වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණෙන විශාලතම සංචාරක කලාපය බටහිර යුරෝපය යි. 2016 වර්ෂයේ දී මෙම කලාපයෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 64 333 කි. (31%)
- නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 20.7% කි. 2016 වසරේ දී වැඩි ම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණි රට ඉන්දියාවයි. දෙවනුව චීනය යි. තෙවන රට එක්සත් රාජධානිය යි. සංචාරකයින් පැමිණීමේ අරමුණ අනුව බලන විට වැඩි ප්‍රතිශතයක් පැමිණ ඇත්තේ විවේකය ගත කිරීම සඳහා ය.
- මෑත වර්ෂවල සංචාරක ඉපැයීම් අඛණ්ඩ ව වර්ධනය වූ අතර එමඟින් සේවා ගිණුම ශක්තිමත් විය. 2016 වසරේ මුළු සංචාරක ඉපැයීම් එක්සත් ජනපද ඩොලර් මිලියන 3 518කි. එය පෙර වසරට වඩා 18%ක වර්ධනයකි.

- මෑත වර්ෂවල සංචාරක අංශයේ ආයෝජන දිගින් දිගට ම වර්ධනය විය. 2015 වසරේ අනුමත වූ හෝටල් ව්‍යාපෘති 37ක් සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 526කින් සමන්විත හෝටල් ව්‍යාපෘති 41ක් සඳහා අනුමැතිය ලැබී තිබිණි.
- රටෙහි නැගෙනහිර හා උතුරු පළාත්වල සංචාරක කර්මාන්තයේ ඉහළ විභවයක් උකහා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවධානය යොමුවීමත් සමඟ එම පළාත්වල සංචාරක කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනයක් විය.
- පසුගිය වසර කිහිපය තුළ ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන් හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර මෙරටට විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වුව ද ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළෙඳ පොළ තුළ තම පූර්ණ විභවතාව ළඟා කර ගෙන නොමැත.

රටවල් අනුව සංචාරක පැමිණීම් - 2018



මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක පැමිණීම් සහ ඉපැයීම්



මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2014	2015	2016	2017	2018 (අ)	වාර්ෂික වෙනස්වීම (%) 2018
සංචාරක පැමිණීම් (සංඛ්‍යාව)	1,527,153	1,798,380	2,050,832	2,116,407	2,333,796	10.3
පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන						
විනෝදාස්වාදය	1,037,644	1,198,240	1,710,027	1,744,149 (ආ)	1,979,819	13.5
ව්‍යාපාර	20,270	23,323	37,121	70,683 (ආ)	71,255	0.8
වෙනත්	469,239	576,817	303,684	301,575 (ආ)	282,722	- 6.3
සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්)	15,119	18,163	20,918	23,068	25,205	9.3
කාමර උපයෝජන අනුපාතය (%)	74.3	74.5	74.8	73.3	72.8	- 0.7
දළ සංචාරක ලැබීම් (රු. මිලියන)	317,479	405,492	512,373	598,143	711,961	19.0
ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.)	207,889	225,476	249,837	282,622	305,066	7.9
මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ඇ)	299,890	319,436	335,659	359,215	388,487	8.1
සෘජු සේවා නියුක්තිය	129,790	135,930	146,115	156,369	169,003	8.1
වක්‍ර සේවා නියුක්තිය	170,100	183,506	189,544	202,846	219,484	8.2

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග

- සංචරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමී ව හෝටල් කාමර ප්‍රමාණවත් නො වීම. අපේක්ෂිත විශාල සංචරක ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හොටල් කාමර 40 000 – 50 000ක ප්‍රමාණයක් අවශ්‍යය වේ යැයි ඇස්තමේන්තු කර ඇතත් 2016 වර්ෂය අවසානයේ දී සංචාරක හොටල් හා අතිරේක ආයතන යන දෙ අංශය ම සතු ව ඇත්තේ හෝටල් කාමර 34 000 කි.
- සංචරක ක්ෂේත්‍රෙය් නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍යය සේවක පුහුණු කිරීම් රජයට සිදු නො කළ හැකි බැවින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් ව කටයුතු කිරීම අත්‍යවශය වේ.

- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නො වීම. බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හොටල් ව්‍යාපාර ශ්‍රී ලංකාවේ තවමත් ප්‍රමාණවත් පිරිදි ව්‍යාප්ත කර නැත. ෆොබ්ස් සඟරාව නම් කර ඇති ලොව හොඳ ම අන්තර්ජාතික සුඛෝපභොගී හොටල් දාම සන්නාම දහයක් අතුරෙන් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ තුනක් පමණි.
- සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද කර්මාන්තය තුළ සැලකිය යුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ. නොවිධිමත් අංශය තුළ සංචරක කර්මාන්තයේ ආරක්ෂාව හා ආචාර ධර්ම වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වනු ඇත.

- විශාල විභවතාවයක් සහිත චීනයෙන් පැමිණෙන සංචරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමේ ඇති හැකියාව සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයින් සඳහා අවශ්‍යය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහි දී චීන භාෂාවෙන් විකාශනය වන රූපවාහිනිය හා ගුවන්විදුලි නාලිකා, චීන භාෂාවෙන් කතා කරන සංචාරක මඟ පෙන්වන්නන් ආදිය අවශ්‍යය වේ.
- සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එක ලෙස ම පැවතීම. ප්‍රධාන වශයෙන් සංචාරකයන් සඳහා පවතින ක්‍රියාකාරකම් අඩු වීම නිසා සංචාරකයෙකු නැවතී සිටින කාල සීමාව රාත්‍රී 10ක් ලෙස නො වෙනස් ව පවතී. මෙහි දී මඟී නෞකා, සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කරගත් සංචාර, විනෝදාස්වාදය අරමුණු කර ගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

- තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නො ව බස් රථ, කුලී රථ හා හෝටල් වෙන් කිරීම, ජංගම දුරකථන සම්බන්ධතා වයි - ෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයන්ට සේවා සපයන්නා වූ බහුකාර්ය තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීම අත්‍යවශ්‍යය වේ.
- සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු ම පාර්ශවකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍යය වන අතර එමඟින් වඩා සහසම්බන්ධතාවයකින් යුතු ඉහළ මට්ටමේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමට ඉඩ සැලසෙනු ඇත.

04 දැනුම් ආර්ථිකය.

- දැනුම් ආර්ථිකය යනු බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පාරිභෝජන හා නිෂ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල සියලු ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල කොටසකි. දැනුම් ආර්ථිකය තුළ ස්වාභාවික වටිනාකම්වලින් සැලකිය යුතු කොටසක් අශ්පෘෂ්‍ය වත්කම්වලින් සමන්විත වන අතර එහි සේවක දැනුම් (බුධිමය ප්‍රාග්ධනයේ) වටිනාකමක් ඇතත් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්ම අනුව මෙම වත්කම් ශේෂ පත්‍රවල ඇතුළත් කිරීමට ඉඩ නො දෙනු ඇත.
- සංවර්ධිත රටවල් කෘෂිකර්මාන්තය හා නිෂ්පාදන ආර්ථිකය පදනම් කර ගෙන සිටින අතර දියුණු වෙමින් පවතින රටවල නිෂ්පාදනය හා සේවා පාදක ආර්ථිකයක් ද වර්ධනය වී ඇති අතර සංවර්ධිත රටවල සේවා ආර්ථිකය පදනම් කර ගෙන ඇති බව පෙනේ.

- තොරතුරු යුගයේ දී ගෝලීය ආර්ථිකය , දැනුම් ආර්ථිකය වෙත යොමු විය. තොරතුරු යුගයට මෙම සංක්‍රමණය ඇතුළත් වන්නේ සේවා කාර්යක්ෂම,නිෂ්පාදන කාර්යක්ෂම හා ශ්‍රම සූක්ෂම ආර්ථික වර්ධකයන්ගෙන් ලබා ගන්නා ලද හොඳ ම භාවිතයන් ය. දැනුම් හා දැනුම් පදනම් කර ගත් සාධක එකතු කර ඇති අන්තර් සම්බන්ධතා සහ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශ වන දැනුම් හා වෙළෙඳ රහස් ආර්ථික වර්ධනයේ තීරණාත්මක සාධකයක් වන අතර ආර්ථික සම්පතක් ලෙස ද වැදගත් වේ.
- දැනුම හා අධ්‍යාපනය යනුවෙන් හඳුන්වන මානව ප්‍රාග්ධනය ඵලදායි වත්කමක් ලෙස හෝ ව්‍යාපාර නිෂ්පාදනයක් ලෙස හෝ යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරයි. නිෂ්පාදිත පරිභෝජනයට හෝ අපනයනය සඳහා හෝ යොදා ගත හැකි අතර මානව ප්‍රාග්ධනය ව්‍යාපාර සඳහා සහ ආර්ථිකය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට යොදා ගත හැකි ය.

දැනුම පදනම් කර ගත් ආර්ථිකය ආශ්‍රිත වැදගත් සංකල්ප

1. දැනුම්කරුවන්.
2. දැනුම් ඉංජිනේරුවන්.
3. දැනුම් ප්‍රාග්ධනය.
4. බුද්ධිමය ප්‍රාග්ධනය.
5. බුද්ධිමය දේපොළ.

දැනම් ආර්ථිකයක් කරා යාමේ අභියෝග.

1. ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම.
2. මේ නිසා අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පවතී. මෙ නිසා මානව ප්‍රාග්ධන සමුච්චිතය පහළ ගොස් ඇත.
3. පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කරන අරමුදල් පහළ මට්ටමක පැවතීම.
4. ශ්‍රී ලංකාව තුළ පවතින අඩු නිපුණතා හා අඩු වැටුප් පදනම් කර ගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරුවීමෙ හැකියාව අඩු වී ඇත.

5. 1998 වන විට ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක සිට පහළ මැද ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමඟ ශ්‍රී ලංකාවට විදේශයන්ගෙන් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා වීම.
6. මේ නිසා අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය අඩු වී ඇත.
7. සෘජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රම සූක්ෂම කර්මාන්ත වෙත බහුල වශයෙන් ගලා ඒම නිසා මානව ප්‍රාග්ධන සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්තා අඩු වීම.

දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශක

1. ආර්ථික සානුබල හා ආයතනික ව්‍යුහය.
2. නව්‍යතාවයන් හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ නැඹුරුව.
3. අධ්‍යාපනය හා පුහුණුව.
4. I C T යටිතල පහසුකම්

මෙම දර්ශක අනුව 2012 වර්ෂයේ දී ප්‍රමුඛස්ථානය ගත් රටවල්

1. ස්වීඩනය.
2. ෆින්ලන්තය.
3. ඩෙන්මාර්කය.
4. නෙදර්ලන්තය.
5. නොර්වේ.

05.

ප්‍රාදේශීය සංවර්ධනය

- නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යපෘතිවල වැඩි ප්‍රලාභ හිමි වූයේ නාගරික අංශයට යි. ඒ නිසා ශ්‍රී ලංකාවේ ඉහළ ආර්ථික වෘද්ධියක් හා සමාජ සංවර්ධනයක් හිමි කර ගනු ලැබුවේ බස්නාහිර පළාතෙන් කොළඹ දිස්ත්‍රික්කය යි. දිවයිනේ සෙසු පළාත් හා දිස්ත්‍රික්ක ඊට සමගාමී ව අඩු සංවර්ධන මට්ටමක් හිමි කර ගත් නිසා තුලිත ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති තෝරා ගත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරිණි.
- ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත, උතුරු පළාත, ඌව පළාත්වල විරැකියාව, ආදායම් ව්‍යාප්ත වීමේ විෂමතා හා දරිද්‍රතාව ඉහළ මට්ටමක තිබූ අතර යටිතල පහසුකම් හා මානව නිපුණතා සංවර්ධනය අඩු මට්ටමක පැවතිණි. මේ නිසා එම දිස්ත්‍රික්ක අළලා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැඟුණි. ඒ සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

  ග්‍රාම ශක්ති ව්‍යාපාරය, ගම්පෙරළිය වැඩසටහන, උදාගම් වැඩසටහන, ගම නැඟුම, ගැමි පුබුදුව, ගැමිදිරිය, ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම ඒ අතර වේ.

12.3
සමකාලීන ආර්ථික සිදුවීම් හා ප්‍රතිපත්ති.

- වර්තමාන ලෝකයේ සෑම රටක් ම බාහිර ලෝකයට විවිධ ප්‍රමාණයෙන් විවෘත ව පවතී. එනම් ආවෘත ආර්ථිකයක් ලෝකයේ කිසිදු රටක දක්නට නැත. ඒ නිසා ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට දේශීය සංසිද්ධි මෙන් ම ගෝලීය සිදුවීම් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි.
- මෙහි දී දේශීය හා ගෝලීය සිදුවීම් ආර්ථිකයේ විවිධ අංශ වෙත සෘජුව ම හෝ වක්‍ර ලෙස බලපෑම් ඇති කරයි. එනම් සාර්ව ආර්ථිකයේ,
  - නිෂ්පාදනය.
  - සේවා නියුක්තිය.
  - මිල මට්ටම්.
  - පොලී අනුපාත.
  - අන්තර්ජාතික වෙළෙඳාම.
  - ගෙවුම් ශේෂය.
  - විදේශ විනිමය අනුපාතිකය.
  - ප්‍රාග්ධන වෙළෙඳ පොළ.

ආර්ථිකයට බලපාන දේශීය සිදුවීම්.

- ආණ්ඩු බලය වෙනස් වීම.
  - 1977 දී පත්වූ නව රජය ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා විදේශ වෙළෙඳ රටාව, දේශීය වෙළෙඳ පොළ රටාව, කර්මාන්ත ව්‍යුහය, මූල්‍ය හා බැංකු පද්ධතිය මුළුමනින් ම වෙනස් විය.
  - 1994 දී ආණ්ඩු බලය වෙනස් වීම සමඟ ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස් වීම් නිසා ආර්ථිකය ගමන් කළ දිශාව කිසියම් ප්‍රමාණයකින් වෙනස් විය. එනම් ආර්ථිකයේ විවෘත භාවය ඉතා සුළු ප්‍රමාණයකින් අඩු කිරීම, පෞද්ගලීකරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම, මිල ස්ථායිතාව, සේවා වියුක්ති ගැටලු අවම කිරීම, නීති හා සාමය තවදුරටත් ශක්තිමත් කිරීම ආදී වශයෙන් කාලීන වෙනස්වීම් ගණනාවක් සිදුවිය.

- 2006 වර්ෂයේ දී ආණ්ඩු බලය වෙනස් වීමත් සමඟ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නව ආර්ථික ප්‍රතිපත්ති හා ගැළපුම් ක්‍රියාත්මක කිරීම සිදුවිය.
    - දේශීය කර්මාන්ත අංශය ශක්තිමත් කිරීම.
    - පෞද්ගලීකරණ වැඩ පිළිවෙළ සීමා කිරීම.
    - විදේශ ආයෝජන මෙරටට ගලා ඒම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
    - විදේශ ණය ගැනීම් වැඩි කිරීම.
    - යටිතල පහසුකම් සංවර්ධනය.
    - කර්මාන්ත හා කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය.

- 2015 වර්ෂයේ ආණ්ඩු බලය වෙනස් වීමත් සමඟ,
  - නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම.
  - සමාජයීය වෙළෙඳ පොළ ආර්ථිකයක් කරා නැඹුරු වීම.
  - යහපාලනය පිළිබඳ කථිකාව.
  - ජාතික ඒකබද්ධතාවක් ඇති කිරීම.
  - පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීම.

ආදී වෙනස්කම් සිදු විය.

- 1983 වර්ෂයේ සිට 2009 දක්වා අවුරුදු 30ක කාලයක් පැවති යුද තත්වය නිසා
  - රටේ යටිතල පහසුකම්, කර්මාන්ත ශාලා, කෘෂිකාර්මික ගොවිබිම් විනාශ විය.
  - නිෂ්පාදනය පහත වැටිණි.
  - විරැකියාව වැඩි විය.
  - දේශීය සම්පත් ඌන උපයෝජනයට ලක් විය.
  - රජයට ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශල වියදමක් දැරීමට සිදුවිය.

- 1989 සිට 1991 දක්වා දිවයිනේ සෙසු ප්‍රදේශවල ක්‍රියාත්මක වූ සිවිල් අරගල නිසා ද
  - රටේ නිෂ්පාදනය පහළ ගියේ ය.
  - මිල මට්ටම ඉහළ ගියේ ය.
  - රාජ්‍ය හා පෞද්ගලික දේපොළ විනාශ වීම.
  - යටිතල පහසුකම් විනාශ වීම.

යනාදිය සිදු විය.

- එමෙන් ම වරින්වර ඇති වූ ස්වාභාවික විපත් ශ්‍රී ලංකා ආර්ථිකයට බොහෝ බලපෑම් සිදු කළේ ය.
  - 2004 වර්ෂයේ ඇති වූ සුනාමි තත්ත්වය.
  - වරින් වර ඇති වූ ගංවතුර හා නායයෑම්.
  - වරින් වර ඇත් වූ නියඟ තත්ත්ව.
  - වනසතුන්ගෙන් ඇති වන හානි.

- මෑත කාලීනව ක්‍රියාත්මක වූ ආගමික අන්තවාදී ගැටුම් ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය. ඒ අතර 2019 වර්ෂයේ සිදු වූ පාස්කු බොම්බ ප්‍රහාරය නිසා සංචාරක කර්මාන්තයට මෙන් ම විදේශ ආයෝජන මෙරටට ගලා එම සම්බන්ධයෙන් ද දැඩි බලපෑමක් සිදු කළේ ය.
- දීර්ඝ කාලයක් පුරා ක්‍රියාත්මක වූ වැඩවර්ජන හා උද්ඝෝෂණ ව්‍යාපාරයන් ද රටෙහි පැවති අස්ථාවර දේශපාලන ස්වභාවය ද රටේ ආර්ථික කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය.
- අක්‍රමවත් මූල්‍ය පාලනය හා අවිධිමත් මූල්‍ය හැසිරවීම,විනිවිද බවින් තොර ණය කළමනාකරණය ආර්ථිකයේ බිඳ වැටීමට හේතු විය. මේ නිසා විදේශ සංචිත හිගවීම, විදේශ ණය අර්බුදය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ගැටලු නිර්මාණය විය.
- විනිමය අනුපාතය ස්ථාවර ව පවත්වා ගැනීම නිසා විදේශ විනිමය අර්බුදය උග්‍ර අතට පත් විය.

- රසායනික පොහොර භාවිතය තහනම් කිරීම මෙරට කෘෂිකර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල කළේ ය. මේ නිසා දේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය අඩු වීමත් ආහාර ද්‍රව්‍යවල මිල ඉහළයාමත් නිසා විශාල වශයෙන් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට සිදුවිය.
- ඉන්ධන මිල ගණන් ඉහළ යෑම විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතුවලට සෘජුව දැඩි බලපෑමක් එල්ල කළේ ය. මේ නිසා අත්‍යවශ්‍යය භාණ්ඩවල මෙන් ම ආහාර ද්‍රව්‍යවල මිලගණන් ද ඉහළ ගියේ ය. ජනතාවගේ ජීවන තත්වය හා පෝෂණ මට්ටම කෙරෙහි මෙය තදින් බලපෑවේ ය.
- ඉන්ධන මෙන් ම වෙනත් බලශක්ති ප්‍රභවයන්ගේ ඇති වූ ගැටලු ද මෙට ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල කළේ ය. විදුලිබල අර්බුදය මෙන් ම ගෑස් අර්බුදය ද ඒ අතර වෙයි. සුළු පරිමාණ හා මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට මෙන් ම සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතු කෙරෙහි ද මේවා තදින් බලපෑවේ ය.

- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අඩුවීම නිසා 2021 වර්ෂයේ දී විදේශීය ජංගම ගිණුමේ හිග සැලකිය යුතු පරිදි ඉහළ ගියේ ය.



- අපනයන ආදායම් ඉක්මවා ආනයන වියදම් ඉහළ යාම. මෙ නිසා වෙළෙඳ හිගය පුළුල් විය. මේ සඳහා ආනයනික භාණ්ඩවලි මිල ඉහළ යෑම, එන්නත් වැනි ඖෂධ ආනයන වියදම් ඉහළ යාම, ආනයන මත පනවා තිබූ ඇතැම් සීමා ලිහිල් කිරීම හා ඉන්ධන ආනයනය හේතු විය.
- ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ආහාර හා ආහාර නො වන ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ඉහළ යාමත් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යාමත්, අභ්‍යන්තර සැපයුම් ජාලවල ඇති වූ අවහිරතා, විවිධ මිල සංශෝධන නිසා ඇති වූ සෘජු හා වක්‍ර බලපෑම්, දේශීය භාණ්ඩ ඉල්ලුම ඉහළ යාම වැනි කරුණු නිසා පොදු මිල මට්ටමේ ඉහළ යාමක් වාර්තා කළේ ය.
- කොවිඩ් 19 වැනි වසංගත තත්ත්ව නිසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති දැඩි බලපෑමට ලක් විය.දරිද්‍රතාවයට අදාළ බහුමාන දත්තවලට අනුව ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයෙන් පෙළෙන බව අනාවරණය වී ඇත. එමෙන් ම ජනගහනයෙන් 42% පමණ විහීනතාවයෙන් පෙළෙන බව ද අනාවරණය වී ඇත.

පාසල්

වසා තිබූ අතර පාසල් හා උසස් අධ්‍යාපන කටයුතු මාර්ග ගත

ක්‍රමවේදයට පවත්වා ගෙන යනු ලැබීය. මේ නිසා අන්තර්ජාල

භාවිත

ඉහළ ගියේය.



❖ විදේශ විනිමය ලැබීම් සීමා වීම හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් මාධ්‍යයේ නිල සංචිත පහළ යෑම.

ගෙවුම් තුලනය



2020 වර්ෂයේ මෙන් ම 2021 වර්ෂයේ ද සමස්ත ශේෂය හිගයක් වාර්තා කළේ ය.

දළ නිල සංචිත හා මුළු වත්කම්



දළ නිල සංචිත

2020 = ඇමරිකන් ඩොලර් බිලියන 5.7 (ආනයනික මාස 4.2)

2021 = ඇමරිකන් ඩොලර් බිලියන 3 . 1 (ආනයනික මාස 1. 8)

- 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශ ණය තත්ත්වය ඉහළයෑම. මුළු විදේශීය ණය ප්‍රමාණය 2020 වර්ෂය අවසානයේ ඇමරිකන් ඩොලර් බිලියන 49.7කි එය දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 60.5 %කි. එමෙන් ම 2021 වර්ෂය අවසානයේ දී මුළු විදේශීය ණය ප්‍රමාණය ඇමරිකන් ඩොලර් බිලියන 50.7 කි එය දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 60%කි.

❖ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම පහළම අගය වාර්තා කිරීම ලිහිල් බදු තන්ත්‍රයක් පවත්වා ගෙන යාම, ආනයන සීමා කිරීම්, ආර්ථිකය යථා තත්ත්වට පත්වීම මන්දගාමී වීම යන කරුණු මේ සඳහා බලපෑවේ ය.

රාජ්‍ය ආදායම් සම්පිණ්ඩනය

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රුපියල් මිලියන		
බදු ආදායම	**1,216,542**	**1,298,019**
ආදායම් බදු	268,249	302,115
එකතු කළ අගය මත බදු	233,786	308,213
නිෂ්පාදන/සුරා බදු	321,932	306,861
ආනයන මත බදු	114,183	64,339
අනෙකුත් බදු	278,392	316,490
බදු නොවන ආදායම	**151,417**	**159,052**
මුළු ආදායම	**1,367,960**	**1,457,071**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
බදු ආදායම	**8.1**	**7.7**
ආදායම් බදු	1.8	1.8
එකතු කළ අගය මත බදු	1.6	1.8
නිෂ්පාදන/සුරා බදු	2.1	1.8
ආනයන මත බදු	0.8	0.4
අනෙකුත් බදු	1.9	1.9
බදු නොවන ආදායම	1.0	0.9
මුළු ආදායම	**9.1**	**8.7**

රාජ්‍ය ආදායමේ සංයුතිය



මූලය: මුදල් අමාත්‍යාංශය

- 2021 වර්ෂයේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් දුර්වල වූ අතර අයවැය හිගය මූල්‍යකරණය දේශීය මූලාශ්‍ර හරහා සිදු කළේ ය. 2020 වර්ෂයේ වාර්තා වූ අය වැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 11.1% කි. (රුපියල් බිලියන 1 667 .7කි) 2021 වර්ෂයේ දී අය වැයි හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 12.2% (රුපියල් බිලියන 2 057.9 කි) 2021 වර්ෂයේ වර්තන ගිණුමේ හිගය රුපියල් බිලියන 1 290.4 වාර්තා විය.
- ඉල්ලුම් හා සැපයුම් යන අංශයන්හි ප්‍රවණතා හේතුවෙන් 2021 වර්ෂයේ උද්දමනය ඉහළ ගියේ ය. 2021 වර්ෂයේ අවසානය වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකය 12.1% කින් ඉහළ ගිය අතර 2022 අප්‍රේල් මාසයේ දී 29.8%කින් ඉහළ ගියේ ය.

ආර්ථිකයට බලපාන ගෝලීය සිදුවීම්.

- ආසියාතික මූල්‍ය අර්බුදය.

  අග්නිදග ආසියා කලාපයේ මූල්‍ය වෙළෙඳ පොළ දැඩි පීඩනයකට ලක්වීම නිසා එම කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් ඒකක දැඩි ලෙස අවප්‍රමාණය විය. මේ නිසා ශ්‍රී ලංකා රුපියල ද අවප්‍රමාණය විය. එම කලාපයෙන් අනයන කරන භාණ්ඩවල මිල ගණන් මේ නිසා ඉහළ ගියේ ය.

- යුරෝපා ආර්ථික අර්බුදය.

  2006 වර්ෂයේ සිට ඇමරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ ආර්ථික අවපාතය නිසා එම කලාපයේ නිෂ්පාදනය පහළ ගිය අතර විරැකියාව වැඩි විය. මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. දැඩි රාජ්‍ය ණය අර්බුදයක් හට ගැණිනි. මෙය ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳ පොළ, විදේශ සේවා නියුක්තිය, විදේශ ආයෝජන කෙරෙහි විශාල බලපෑමක් සිදු කළේ ය.

- ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගට ම ඇති වූ අර්බුදයන්.

  විශේෂයෙන් ඉරානය, ඇෆ්ගනිස්ථානය, සිරියාව, යුක්රේනය හා රුසියාව ආදී රටවල ඇති වූ යුද ගැටුම් නිසා ඛනිජ තෙල් මිල ඉහළ යාම, ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳ පොළ බිඳ වැටීම හා විදේශ ආයෝජන අඩු වීම කෙරෙහි බලපෑවේ ය.

- ලෝකයේ ඛනිජ තෙල් හා රත්‍රන් මිල ඉහළ යාම.

  මේ නිසා ලංකාවේ ආනයන වියදම් ඉහළ යාම, ගෙවුම් ශේෂ හිගය, රුපියලේ විදේශ අගය අඩු වීම, බලශක්තිය හා බැඳුණු උද්දමනය ඉහළ යාම යන අංශයන්ගෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බල පා ඇත.

- ලෝක ආහාර හිගය.

  2000 වර්ෂයේ මුල් වකවානුවේ දී ලෝකයේ ආහාර නිෂ්පාදනය කරන රටවල්වල ඇති වූ බලපෑම් නිසා සහ ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් යොදා ගැනීම නිසා දැවැන්ත ආහාර හිගයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරන තිරිඟු පිටි, කිරිපිටි, සීනි ආදී ආහාරවල මිල ගණන් ඉහළ ගියේ ය.

- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව.

  ශීඝ්‍ර කාර්මීකරණයක් සමඟ ගෝලීය අවකාශයට මුදා හැරෙන අහිතකර වායූන් නිසා ගෝලීය උෂ්ණත්වය ශීඝ්‍ර යෙන් ඉහළ යාමෙන් ග්ලැසියර් දියවීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සිදුවේ. එමෙන් ම සාගර සම්පත් විනාශ වීම, භෝග ඵලදාව අඩු වීම ද මේ නිසා සිදුවේ. කෘෂිකාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෙම තත්ත්වය විශාල වශයෙන් බලපායි.

- චීනයේ වූහාන් නගරය කේන්ද්‍ර කර ගනිමින් ඇති වූ කොරෝනා රෝගය සමස්ත ලෝකයට ම දැඩි බලපෑමක් එල්ල කළේ ය. 2019 වර්ෂයේ ඇති වූ මෙම රෝග තත්ත්වය වර්තමාන ලංකාවේ ඇති තිබෙන බොහෝ ආර්ථික සමාජ හා දේශපාලනික තත්ත්වයන්ට බලපා ඇත. රෝග මර්දනයට ගන්න ලද සෞඛ්‍යමය ක්‍රියාමාර්ග නිසා මෙම දැඩි බලපෑම සිදු විය.

මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ඉතිහාසයේ අන් කිසි දිනක මුහුණ නොදුන් පීඩාකාරී තත්ත්වයකට ගොදුරු වී ඇත.

1. අවම මට්ටමේ නිල සංචිත.
2. ඇතැම් විදේශ ණය ගෙවීම් අත්හිටුවීම.
3. ඉහළ යන උද්දමනය.
4. විනිමය අනුපාතිකය සැලකිය යුතු පරිදි අවප්‍රමාණය වීම.
5. ඉතා අඩු රාජ්‍ය මූල්‍ය අවකාශය.
6. ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බලපෑම් සිදු කරන බලශක්ති අර්බුදය.
7. සමාජ හා දේශපාන නොසන්සුන්තාව.

මෙම සමාජ ආර්ථික පීඩනයන්ගෙන් මිදී යහපත් ආර්ථිකයක් සමාජ දේශපාලනික වටපිටාවක් නිර්මාණය කර ගැනීම අප සියලු දෙනාගේ වගකීමකි.

ස්තූතියි!